ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.
☎ 011 279 7400
011 286 4051


මගේ අංකය / எனது இல / My No. LCGD/AD/7/7/1 (2020)    ඔබේ අංකය / உமது இல / Your No    දිනය / திகதி / Date 2020.02. 26

චක්‍රලේඛ අංක 2020/5

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු

ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්වරු (අන්තර් පළාත්)

## නාගරික ප්‍රදේශවල පදිංචිය සඳහා ඉඩම් ලබා දීමේදී සහන සැලසීම

"2015 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම. නාගරික ප්‍රදේශවල පදිංචිය සඳහා ඉඩම් ලබා දීමේ දී සහන සැලසීම" මැයෙන් නිකුත් කර ඇති 2015.01.01 දිනැති 2015/01 දරන චක්‍රලේඛය, 2015.04.16 දිනැති 2015/01(I) දරන චක්‍රලේඛය හා 2016.02.29 දිනැති 2015/01 (II) දරන චක්‍රලේඛය අවලංගුකර පරිශීලනයේ පහසුව සඳහා අදාල පැහැදිලි කිරීම් සහිතව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබයි. අතිගරු ජනාධිපති සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 2015 වර්ෂයේ අයවැය කතාවේ අංක 35:1 දරණ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මේ මගින් නිකුත් කරනු ලැබේ.

02. නාගරික සංවර්ධන අධිකාරිය හෝ භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් හෝ රජය විසින් යම්කිසි විශේෂ ව්‍යාපෘතියක් යටතේ නාගරික ප්‍රදේශ හෝ වැඩිදියුණු කළ ප්‍රදේශ ලෙස නම්කර ඇති ප්‍රදේශවල පුද්ගලයින්ට රජයේ ඉඩම් ලබා දීමේදී රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝ කාලීන බදුකර හෝ එම පනත යටතේ දීමනාපත්‍ර ලබා දෙනු ලැබේ. එහෙත් මෙසේ ඉඩම් ලබා ගැනීමේදී අඩු ආදායම්ලාභී පුද්ගලයින් හට අධික බදු ගෙවීමට හැකියාවක් නොමැති බවට මෙතෙක් නිරන්තරයෙන් කරුණු ඉදිරිපත් කර තිබිණි. මෙයට පිළියමක් ලෙස එවැනි පුද්ගලයින් වෙත සහන සැලසීම සඳහා වූ යෝජනාවකට මෙසේ අනුමැතිය ලැබී ඇත.

03. මේ අනුව 2015.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය හෝ භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් හෝ රජය විසින් යම්කිසි විශේෂ ව්‍යාපෘතියක් යටතේ නාගරික ප්‍රදේශ හෝ වැඩිදියුණු කළ ප්‍රදේශ ලෙස නම්කර ඇති ප්‍රදේශවල පදිංචිය සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු ක්‍රමයට ඉඩම් ලබා දීමේදී පහත සඳහන් ආකාරයට බදු අයකළ යුතු බව කාරුණිකව දන්වමි.

I. පවුලේ වාර්ෂික ආදායම රුපියල් 300,000 දක්වා වූ පුද්ගලයින්ගෙන් වාර්ෂිකව නාමික බද්දක් අය කෙරේ. නාමික බදු මුදල රුපියල් 1,000.00 හෝ ඉඩමේ නොදියුණු වටිනාකමින් 0.5%ක මුදල යන අගයන්ගෙන් වඩා අඩුවන මුදල විය යුතුය.

II. පවුලේ වාර්ෂික ආදායම රුපියල් 300,000ට වැඩි රුපියල් 400,000 දක්වා වූ පුද්ගලයින්ගෙන් 0.5%ක බද්දක් අය කෙරේ.

III. පවුලේ වාර්ෂික ආදායම රුපියල් 400,000ට වැඩි රුපියල් 500,000 දක්වා වූ පුද්ගලයින්ගෙන් 1%ක බද්දක් අය කෙරේ.

IV. පවුලේ වාර්ෂික ආදායම රුපියල් 500,000ට වැඩි රුපියල් 600,000 දක්වා වූ පුද්ගලයින්ගෙන් 2%ක බද්දක් අය කෙරේ.

V. පවුලේ වාර්ෂික ආදායම රුපියල් 600,000ට වැඩි පුද්ගලයින්ගෙන් 4%ක බද්දක් අය කෙරේ.

මෙම බදු අය කිරීමේදී පදනම් කරගත යුතු වන්නේ ඉඩම් ලබා දීම සඳහා පුද්ගලයා තෝරාගනු ලබන දිනයේ පැවති ඉඩමේ නොදියුණු වටිනාකම බවද කාරුණිකව සලකන්න.

04. ඉඩම් ලබා දීම සඳහා පුද්ගලයා තෝරා ගනු ලබන දිනයේ සිට 2015.01.01 දක්වා හිඟ බදු මුදල් අය කරනු නොලැබේ. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දින වන විට ගරු අමාත්‍යතුමාගේ බදු අනුමැතියක් ලබාගෙන ඇති එහෙත් බදුකරයක් නිකුත් කර නොමැති බදුකරුවන් සඳහා ඔවුන් තෝරාගෙන ඇත්තේ රජයේ ඉඩම් ආඥා පනතේ දැක්වෙන පරිදි විධිමත් ක්‍රමවේදයක් යටතේ නම් එහිදී අය කරන වාර මුදල කපා හරිනු ලැබේ. එහෙත් අනවසර පදනම මත තෝරා ගන්නා ලද ඉඩම්වලට අදාළව අය කරනු ලබන දඩ මුදල කපා හරිනු නොලබන බව සලකන්න.

05. මෙම චක්‍රලේඛයෙන් ආවරණය වනු ලබන ඉඩමක් වෙනුවෙන් මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයට පෙර බදු අනුමැතිය ලබා දී ඇති එහෙත් දීර්ඝකාලීන බදුකරයක් නිකුත් වී නොමැති අවස්ථාවලදී අනුමත කර ඇති හිඟ බදු මුදල් කපා හැරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්ට පිටපතක් සමඟ මා වෙත විස්තර සහිතව නිර්දේශ ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. අනුමැතිය ලබා ගැනීමෙන් පසුව බදුකරුට හිඟ බදු කපා හැරීමේ තීරණය දන්වා යැවිය යුතුය. දැනටමත් හිඟ බදු අයකර ඇත්නම් ඉදිරි කාලය සඳහා හිලව්කර ගැනීම සඳහා ද මෙසේ මා වෙතින් අනුමැතිය ලබාගත යුතුය. මෙහි ඇමුණුම 01 ආකෘතිය පරිදි ප්‍රාදේශීය ලේකම්, (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් විසින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

06. මෙම චක්‍රලේඛයෙන් ආවරණය වනු ලබන ඉඩමක් වෙනුවෙන් මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයට පෙර බදු අනුමැතිය ලබා දී ඇති එහෙත් දීර්ඝකාලීන බදුකරයක් නිකුත් වී නොමැති අවස්ථාවලදී ද 2015.01.01 දින සිට නව බදු අනුපාතයන් අදාළ කරගත හැකිය. ඒ අනුව පවුලේ වාර්ෂික ආදායම රු. 600,000/= ට අඩු අයවළුන් සඳහා නියමිත ආදායම් කාණ්ඩය අනුව හිමි බදු සහනය ලබා දීම සඳහා පියවර ගත යුතුය. ඒ සඳහා බදුකරුගේ පවුලේ ආදායම පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ සහතික කිරීමක් (ඇමුණුම අංක 03 පරිදි) සහිතව නියමිත ආදායම් කාණ්ඩය හා ඒ අනුව හිමි බදු අනුපාතය නිර්දේශ කරමින්

අදාල පරිදි ප්‍රාදේශීය ලේකම්, (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් විසින් මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය. ඒ සඳහා මෙම චක්‍රලේඛයේ ඇමුණුම අංක 02 භාවිතා කරන්න. ඉන්පසුව සංශෝධිත බදු මුදල ගණනය කර අදාළ පළාත් ඉඩම් කොමසාරිස් හා මා වෙත පිටපත් සහිතව බදුකරුට දන්වා යැවිය යුතුය. බදුකරු විසින් පැවති සාමාන්‍ය බදු අනුපාතය යටතේ දැනටමත් බදු මුදලක් ගෙවා ඇත්නම් සංශෝධිත බද්ද අනුව ගණනය කළ විට ගෙවා ඇති අතිරික්ත බදු මුදල ඉදිරි වර්ෂවල අයවිය යුතු බදු මුදල් සඳහා හිලව් කළ යුතුය. එසේ හිලව් කරන අකාරය ද අදාළ පළාත් ඉඩම් කොමසාරිස් හා මා වෙත පිටපත් සහිතව බදුකරුට දන්වා යැවිය යුතුය.

07. "මෙසේ හිඟ බදු කපා හැරීමට අදාළව පාලන ගිණුම්වල නිවැරදිව සටහන් තැබිය යුතුය. හිඟ පාලන ගිණුමේ හරට ඇති හිඟය මාගේ අනුමැතිය ලබාගෙන කපා හැරි විට එම අනුමැතිය ලබා දුන් ලිපියේ අංකය සහ දිනය ද සහිතව කපා හැරීමක් ලෙස හිඟ පාලන ගිණුමේ බැරට සටහන් කළ යුතුය. ගෙවා ඇති හිඟ මුදල් ඉදිරි වර්ෂවල ලැබිය යුතු බදු ආදායම් සඳහා හිලව් කිරීමේදී එසේ හිලව් කරන බදු මුදල් ප්‍රමාණය, හිඟ බදු කපා හැරීම/ හිලව් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් ලිපියේ අංකය, දිනය සහිතව බදු ලෙජරයේ අදාළ බදුකරය සහිත ලෙජර් පිටුවේ සටහනක් දැමිය යුතුය. ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී එලෙස හිඟ බදු මුදල් කපා හරින ලද බදුකරයට අදාළව වාර්ෂිකව අයවිය යුතු බදු මුදල (බදු වාරිකය) සැලකිල්ලටගත යුතුය. හිලව් කිරීමේදී අදාළ ප්‍රවර්තන වර්ෂයට අදාලව හිලව් කරන වටිනාකම ප්‍රවර්තන වර්ෂයේ පාලන ගිණුමේ බැරට සටහන් කළ යුතුය. මෙසේ බැරට සටහන් කිරීමේදී "අදාළ අනුමැතිය ලබා දුන් ලිපියේ අංකය සහ දිනය අනුව හිලව් කිරීම" ලෙස බැර සටහනේ විස්තරය සටහන් කළ යුතුය."

08. මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනයෙන් පසුව බදු අනුමැතිය ලබා දෙනු ලබන ඉඩම් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය යටතේ නියමිත දිනයේ සිට බදු අයවන පරිදි අනුමැතිය ලබා දෙන බැවින් ඉහත සඳහන් පරිදි බදු කපා හැරීමක් අදාළ නොවේ.

09. මෙහිදී ඉඩම් සඳහා පුද්ගලයෙකු තෝරාගනු ලැබීම යනුවෙන් අදහස් කරනු ලබන්නේ ඉඩම් කච්චේරි, ටෙන්ඩර්, වෙන්දේසි හෝ වෙනත් නීත්‍යානුකූල ලියවිල්ලක් නිකුත් කර තිබීම වැනි විධිමත් ක්‍රමයකට තෝරාගෙන ඇත්නම් එසේ තෝරාගනු ලැබූ දිනයයි. අනවසරයෙන් අල්ලා ගැනීමේ පදනම මත තෝරාගෙන තිබුණේ නම් 1995.06.15 දිනය ඒ සඳහා අදාළ කරගත යුතුය.

10. නාගරික සංවර්ධන අධිකාරිය හෝ භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් හෝ රජය විසින් යම්කිසි විශේෂ ව්‍යාපෘතියක් යටතේ නාගරික ප්‍රදේශ හෝ වැඩිදියුණු කළ ප්‍රදේශ ලෙස නම්කර ඇති ප්‍රදේශවල පදිංචිය සඳහා රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනාපත්‍රයක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නන් හට එසේ දීමනාපත්‍ර ලබා දීමේදී ඉඩමේ තක්සේරු වටිනාකම සම්පූර්ණයෙන් අයකර තිබිය යුතුය. එහිදී දීර්ඝකාලීන බදු මුදල් වශයෙන් ගෙවා ඇති බදු මුදල අඩුකර ඉතිරි මුදල අයකර යුතුය.

11. මෙම සහනය ලබා දීම තුළින් බදු ගෙවීමේ අපහසුතා හේතුවෙන් මෙතෙක් පදිංචිය සඳහා ඉඩම් හිමිකම නොලැබූ විශාල පිරිසකට ඉඩම් හිමිකම ලබා දීමට අපේක්ෂා කර ඇත. එම නිසා මෙම සහනය සඳහා හිමිකම් ලබන පුද්ගලයින් වෙත මේ පිළිබඳව දැනුවත් කර දීර්ඝකාලීන බදුකර සහ දීමනාපත්‍ර නිකුත් කිරීමේ ඉහළ ඉලක්කයක් කරා ළඟාවීමට ඔබේ සක්‍රීය දායකත්වය ලබා දෙන මෙන් වැඩිදුරටත් දන්වමි. තවද, මෙම සහනය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් ව්‍යාජ ලෙස තම ආදායම අඩුවෙන් පෙන්වමින් බදු අය කිරීමට ඇති ඉඩකඩ නැති කිරීම සඳහා විශේෂයෙන් සැලකිලිමත් විය යුතු බවද අවධාරණය කරමි. ඇමුණුම 3 යටතේ වන ආකෘතියට අනුව ආදායම් වාර්තාව ඉදිරිපත් කළ යුතු අතර පුද්ගලයෙකුගේ ආදායම සහතික කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ වගකීමක් වන බව අවධාරණය කරමි. එවැනි ව්‍යාජ ලෙස ආදායම් තක්සේරු කිරීමේ අවස්ථාවන් අනාවරණය වුවහොත් ඊට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමටද සිදුවනු ඇත.

මෙම උපදෙස් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් ගැටලුවක් උද්ගත වුවහොත් කරුණාකර එම විමසීම් මා වෙත ඉදිරිපත් කරන්න.

ආර්.එම්.සී.එම්. හේරත්
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - කරු.දැ.ගැ.පි.
2. ලේකම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
3. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.පි.
5. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - කරු.දැ.ගැ.පි.
6. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ඇමුණුම I

<u>1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව 1949.09.02 දිනැති අංක 10,013 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආණ්ඩුකාරවරයාගේ නියෝගය අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2020/5 දරන චක්‍රලේඛය ප්‍රකාරව බදු මුදල් කපා හැරීම</u>

දීර්ඝකාලීන බදු අනුමැතිය දීමට අදාළව කපා හැරීමට නියමිත බදු මුදල හා ඊට අදාළ විස්තර පහත පරිදි ඉදිරිපත් කරමි.

1. බදුකරුගේ නම:
2. බදුකරුගේ ලිපිනය:
3. ග්‍රාම නිලධාරී කොට්ඨාශය:
4. බදුකරුගේ පවුලේ වාර්ෂික ආදායම:
5. ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයේ බදු ලිපි ගොනු අංකය:
6. පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ බදු ලිපි ගොනු අංකය:
7. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ බදු ලිපි ගොනු අංකය:
8. බදු අයකිරීමට පදනම් කර ගනු ලබන දිනය:
9. අමාත්‍යතුමා විසින් බදු අනුමැතිය ලබාදුන් දිනය:
10. බදු අයකළ යුතු දිනයේ සිට බදු අනුමත කළ දිනය දක්වා අදාළ බදු මුදල
    I. වාර්ෂික බදු මුදල:
    II. අදාළ වර්ෂ ගණන:
    III. නියමිත බදු මුදල:
    IV. වාර මුදල:
    V. නියමිත මුළු බදු මුදල:
11. දැනට අයකර ඇති බදු මුදල:
12. චක්‍රලේඛය ප්‍රකාරව කපා හැරීමට නිර්දේශ කරනු ලබන බදු මුදල:
13. චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියට හිලව් කිරීමට නිර්දේශ කරනු ලබන බදු මුදල:
14. ඉදිරියට හිලව් කරන්නේ නම් හිලව් කරනු ලබන කාල සීමාව:

ඉහත විස්තර නිවැරදි බවට සහතික කරමි. ඉහත චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව අය විමට ඇති/ අය කරන ලද රු...................... බදු මුදල කපා හැරීම/ ඉදිරියට හිලව් කිරීම නිර්දේශ කරමි.

දිනය : ....................................

.............................................................

ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම්
කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්

පිටපත : පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්

ඇමුණුම II

<u>නාගරික ප්‍රදේශවල පදිංචිය සඳහා ඉඩම් විෂය භාර අමාත්‍යතුමා විසින් ................ දිනට පෙර දීර්ඝකාලීන බදු අනුමැතිය ලබා දී ඇති ඉඩම්වලට අදාළව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2020/5 දරන චක්‍රලේඛය ප්‍රකාරව බදු මුදල් සංශෝධනය සඳහා අනුමැතිය ලබා දීම</u>

1. බදුකරුගේ නම :
2. බදුකරුගේ ලිපිනය :
3. බදුකරුගේ පවුලේ වාර්ෂික ආදායම :
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බදු ලිපිගොනු අංකය :
5. (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලයේ බදු ලිපිගොනු අංකය :
6. පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයේ බදු ලිපිගොනු අංකය :
7. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ බදු ලිපිගොනු අංකය :
8. අමාත්‍යතුමා විසින් බදු අනුමත කර ඇති දිනය :
9. ලබා දී ඇති අනුමැතිය අනුව නියමිත වාර්ෂික බදු වාරිකය :
10. 2015/01 චක්‍රලේඛය අනුව නියමිත ආදායම් කාණ්ඩය හා බදු ප්‍රතිශතය :
11. නිර්දේශ කරනු ලබන සංශෝධිත වාර්ෂික බදු වාරිකය :
12. දැනට අය කරගෙන ඇති බදු මුදල :
13. ඉදිරියට හිලව් කළ යුතු බදු මුදල (අතිරික්තව ගෙවා ඇති):

ඉහත කරුණු සත්‍ය බවට තහවුරු කරමි. බදුකරුගේ ආදායම පිළිබඳ ලේඛන මේ සමඟ අමුණා ඇත.

ඉහත පරිදි බදු මුදල් සංශෝධනය කිරීම/ වැඩිපුර ගෙවා ඇති මුදල් ඉදිරි වර්ෂ සඳහා හිලව් කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

.......................................................

ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්

පිටපත : පළාත් ඉඩම් කොමසාරිස්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස්

ඇමුණුම III

## දීර්ඝකාලීන බදු ලබා දීමේදී බදු සහන ලබා දීමේදී ආදායම සහතික කිරීම

(මෙම ආදායම් වාර්තාව චක්‍රලේඛ අංක 2020/5 යටතේ දීර්ඝකාලීන බදු ලබාදීමේදී බදු සහන ලබාදීම සඳහා පමණක්ම අදාළ වේ.)

1. බදුකරුගේ නම :
2. ජාතික හැඳුනුම්පත් අංකය (ඇත්නම්) :
3. බදුකරුගේ ලිපිනය :
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:
5. ග්‍රාම නිලධාරි වසම:
6. ආදායම ඉදිරිපත් කරන වර්ෂය:
7. බදුකරුගේ වාර්ෂික ආදායම:
   7.1. මූලික වැටුප:
   7.2. ව්‍යාපාර:
   7.3. වෙනත්
8. කලත්‍රයාගේ හා අවිවාහක දරුවන්ගේ වාර්ෂික ආදායම:
   8.1. මූලික වැටුප:
   8.2. ව්‍යාපාර:
   8.3. වෙනත්
9. පවුලේ වාර්ෂික ආදායම:

ඉහත කරුණු සත්‍ය බවට තහවුරු කරමි. බදුකරුගේ ආදායම පිළිබඳ සහතිකය මේ සමඟ අමුණා ඇත.

දිනය : ..........................

..................................

ග්‍රාම නිලධාරි අත්සන

(නිල මුද්‍රාව)

ඉහත තොරතුරු සත්‍ය බව සහතික කරමි.

දිනය : ..........................

..................................

ප්‍රාදේශීය ලේකම් අත්සන

(නිල මුද්‍රාව)